කැලණි විහාරයේ පැරණි බුදු ගෙහි ඇති මහනුවර යුගයේ සිතුවම් සඳහා නාග රූප බහුලව යොදාගැනීම පිළිබඳ ප්‍රසංගික පුරාවිද්‍යා දෘෂ්ටියෙන් අධ්‍යයනයක්

කේනුර ගීසර [1], ගයාන් මධුසංක [2]

පුරාවිද්‍යාත්මක අර්ථ නිරූපණයේ දී අවධාරණයට ලක්වන වස්තුවක නියමානුකූල තේරුම හඳුනාගැනීමටත් එය අයත් ආරම්භක සන්දර්භයන් අධ්‍යයනය කිරීම වැදගත්ය. එය ප්‍රසාංගික පුරාවිද්‍යාව ලෙස හඳුන්වයි. 1980 දශකයේ දී පශ්චාත් සංස්ලේශි වාදයේ පියා වූ ඉයන් හොඩර් විසින් මෙම සංකල්පීය ප්‍රවේශය සාකච්ඡාවට ලක්කර ඇත. මෙම අධ්‍යනය තුළ දී සිතුවම් සම්ප්‍රදායන් අතරින් කැලණි විහාරයේ සිතුවම් හා මූර්ති සඳහා නාග රූප බහුලව යොදාගැනීමට එවකට පැවති සමාජ සංස්කෘතියෙහි බලපෑම අධ්‍යයනය කිරිම අරමුණ වේ. ඒ සඳහා හේතු වූ සංකල්ප මොනවාද? යන්න ප්‍රධාන පර්යේෂණ ගැටළුව වේ. මේ සඳහා අධ්‍යයන ප්‍රදේශ ලෙස බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කැලණිය රජමහ විහාරයේ පැරණි බුදු ගෙය තෝරා ගන්නා ලදී. දත්ත රැස් කිරිමට භාවිත කළ ක්‍රමවේද අතර සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය, සම්මුඛ සාකච්ඡා, සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය, ඡායාරූප අධ්‍යයනය ආදී ක්‍රම යොදා ගැනුණි. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රසංගික පුරාවිද්‍යා දෘෂ්ටිය ට අනුව පුරාතන කාලයට අයත් මනුෂ්‍ය ක්‍රියාවලීන්ට අදාල පාරිසරික හා චර්යාත්මක අංශ මත අවධාරණය කිරීම හා මෙම සිතුවම් ස්ථානගත ව පැවැති පසුබිමෙ අන්තර්ජාලය තුල තිබෙන තොරතුරු අනුව හඳුනාගන්නා ලදී. එහි දී පර්යේෂණ ප්‍රතිඵල ලෙස මෙම ප්‍රදේශයේ ජනතාව තුළ කාලාන්තරයක් මුළුල්ලේ පැවැති ජනප්‍රවාද ගත කරුණු මෙම සිතුවම් නිර්මාණය සඳහා හේතු වූ බව අධ්‍යයනයෙන් පෙනී ගියේ ය. මෙම අධ්‍යයනය මගින් කැලණි විහාරයේ සිතුවම් හා මූර්ති සඳහා නාග රූප බහුලව යොදාගැනීමට හේතු වූයේ එවකට පැවති සාමාජයීය හා සංස්කෘතික කාරණා බව ත්, එය ප්‍රසංගික පුරාවිද්‍යා දෘෂ්ටිය මගින් සනාථ වන බව ත් පෙන්වා දිය හැකි ය.

ප්‍රමුඛ පදඃ කැලණි විහාරය, නාග රූප, ප්‍රසංගික පුරාවිද්‍යාව, සංස්කෘතිය, සිතුවම්

[1] ව්‍යවහාරික පුරාවිද්‍යා අධ්‍යයන අංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය. kenura.00@gmail.com

[2] ව්‍යවහාරික පුරාවිද්‍යා අධ්‍යයන අංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය. galwate2000@gmail.com